විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2016

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2016.04. 27

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගැලපීම</u>**

රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය 2016 යන මැයෙන් නිකුත් කරන ලද 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 05 වන ඡේදයේ සඳහන් පරිදි 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. විශ්‍රාම ලබාගන්නා රජයේ නිලධාරීන්ගේ **<u>විශ්‍රාම වැටුප් සකස් කිරීම සඳහා උක්ත චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් වැටුප් පියවර අවසන් වරට ලබාගත් වැටුප් පියවර ලෙස පාදක කරගත යුතුවේ.</u>**

03. එම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් වැටුප් පරිමාණයන් හිමිගැන්වීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිට වේ. **එදිනට මෙම චක්‍රලේඛය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය වන අතර ඒ පිළිබඳව උපදෙස් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි 05:2** පරිදි පසුව නිකුත් කරනු ලැබේ. එසේම 2016.01.01 සිට 2019.12.31 දක්වා අතර කාලය තුළදී විශ්‍රාම වැටුප සංශෝධනය කරනු නොලැබේ. 2016,2017, 2018, 2019,2020 යන වර්ෂ වලදී විශ්‍රාම ලබා ගන්නා නිලධාරීන් සඳහා ඔවුන් අවසන් වරට ලබාගත් වැටුප පදනම් කරගෙන විශ්‍රාම වැටුප සකස් කළ යුතු අතර ඒ සඳහා ඒ ඒ වර්ෂ වලට අදාළව නිකුත් කර ඇති ප්‍රතිශත වගු භාවිතා කළ යුතුය. (ඇමුණුම I )

04. විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා පාදක කර ගන්නා ප්‍රදාන පත්‍රය (භාණ්ඩාගාර 79) (ඇමුණුම II) සහ PD 03(ඇමුණුම III) ආකෘතිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට අනුකූල වන පරිදි සංශෝධනය කර ඇති අතර, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම ආකෘති අදාළ වන්නේ 2016.01.01 දිනෙන් පසුව සහ 2019.12.31 දක්වා විශ්‍රාම ලබා ගන්නා නිලධාරීන්ට පමණක් වන අතර 2020.01.01 සිට නැවත සංශෝධනය කරන ලද ප්‍රදාන පත්‍රය (භාණ්ඩාගාර 79) සහ PD 03 ආකෘතිය භාවිතා කළ හැකි වේ.

05. 2016.01.01 සිට 2019.12.31 දක්වා විශ්‍රාම ගනු ලබන නිලධාරීන් වෙනුවෙන් භාවිතා කළ යුතු **භාණ්ඩාගාර 79 හි සඳහන් VIII, IX, X යන ඡේදයන් නිවැරදිව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.** එනම් VIII වන ඡේදයේ සඳහන් කළ යුත්තේ සම්පූර්ණ වැටුප් පරිමාණය වන අතර IX ඡේදයේ සඳහන් කළ යුත්තේ 2020.01.01 දිනට ලබාගත යුතු වැටුප් තලය වේ. X වන ඡේදයේ සඳහන් කල යුත්තේ නිලධාරියා විශ්‍රාම ලබා ගන්නා දිනයේදී අදාළ වන වැටුප් තලය වේ.

06. 2016.01.01 දිනෙන් පසුව විශ්‍රාම ලබාගෙන මේ වන විට විශ්‍රාම වැටුප් ලබන නිලධාරීන්ගේ ද විශ්‍රාම වැටුප් සංශෝධන කිරීම සඳහා PD 06 අයදුම්පත ඉදිරිපත් කළයුතු වේ. ඒ සඳහා 03 ඡේදයේ සඳහන් ප්‍රතිශත.වගු හා නව ප්‍රදාන පත්‍රය (භාණ්ඩාගාර 79) භාවිතා කළ යුතු ය.

07. 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 මඟින් මසකට ලබා දුන් රු.3500 ක අන්තර් දීමනාව 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබාගන්නා නිලධාරීන්ට හිමි නොවේ. 2016.01.01 දිනෙන් පසුව විශ්‍රාම ලබාගෙන මේ වන විටත් සංශෝධිත වැටුප ලබා නොගත් විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප සැකසීමේදී මෙතෙක් ලබාදුන් අන්තර් දීමනාව වන රු. 3500 ක දීමනාව අඩුකර හිඟ වැටුප සමඟ ගැලපීමට කටයුතු කරනු ලැබේ. 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/2013 මඟින් මසකට ලබා දී ඇති රු.3525 ක ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**08. මෙම චක්‍රලේඛය නිකුත් කළ දිනෙන් පසුව මෙයට අනුකූල නොවන පරිදි විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අයදුම්පත් නැවත අදාළ ආයතන වෙත එවීමට කටයුතු කරන අතර 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හා මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව සංශෝධනය කරන ලද අයදුම්පත් නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.**

09. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ එකඟතාවය මත මෙම චක්‍ර ලේඛය නිකුත් කරේ.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කරු. දැ. ගැ. සඳහා |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - එම |
| 3. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - එම |
| 4. | ලේකම් | - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 5. | ලේකම් | - මුදල් අමාත්‍යාංශය |
| 6. | ලේකම් | - රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 7. | ලේකම් | - ජාතික වැටුප් කොමිෂන් සභාව |
| 8. | විගණකාධිපති | - අ.ක.ස. |